# ජේ.බී. ගුරුසිංහ එ. ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී.

RTIC Appeal (**පුද්ගලික වශයෙන් විභාග කිරීම**)/ 1427/2019, 1428/2019, 1429/2019 (2019.11.05 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ය නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ය නීතිඥ එස්. ජී. පුංචිහේවා

**අධ්‍යක්ෂ ජනරාල් :** වසන්ත හපුආරච්චි

**අභියාචක** - **ජේ.බී. ගුරුසිංහ**
**නොතිසි ලත් පාර්ශවය** - නම්කළ නිලධාරී, **ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී.**

**පෙනීසිටීම**
අභියාචක - **ජේ.බී. ගුරුසිංහ**
පොදු අධිකාරිය - නීතිඥ රජීව් අමරසූරිය
නීතිඥ ඇන් දේවානන්ද
නීතිඥ පූජනි ගලප්පත්ති

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2019.01.24 |
| තොරතුරු නිලධරයා තීරණය ලබා දුන් දිනය | 2019.02.20 |
| නම් කළ නිලධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2019.02.26 |
| නම් කළ නිලධරයා තීරණය ලබා දුන් දිනය | 2019.03.27 |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2019.04.10 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක විසින් 2019.01.24 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා සිටින ලදි.

> *ශ්‍රී ලංකා ටෙලිකොම් පි.එල්.සි. ආයතනය මගින් 2017 වර්ෂයේදී දිස්ත්‍රික් උසාවියෙහි ගොනු කරන ලද නඩු අංක DSP 12/2017 සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් පි.එල්.සි. ආයතනයෙන් හෝ අනුබද්ධිත ආයතනයන්ගෙන් වැය කරන ලද නීතිඥ ගාස්තු හා අදාළ එම වියදම මේ දක්වා ලබා දෙන්න*

තොරතුරු නිලධාරීයා විසින් 2019.02.20 දිනැතිව පහත පරිදි ප්‍රතිචාර දක්වන ලදි.

A. ඔබ විසින් ඉල්ලා ඇති තොරතුරු මහජන සුභ සිද්ධිය සඳහා හේතු වන බවට හා/හෝ මහජන කටයුත්තකට අදාළ වන බව විශ්වාස කිරීමට සාධාරණ හේතු නොමැත.
B. ඉල්ලා සිටිනු ලබන තොරතුරු 12/2016 දරන පනතේ 5(1)a ,d ,g ,i හා j යන වගන්තිවල ප්‍රතිපාදන යටතට වැටෙන හෙයින් එය ලබා දිය නොහැක.
C. ඉල්ලා සිටිනු ලබන තොරතුරු දැනටමත් අධිකරණ ඉදිරියේ විභාග වෙමින් පවතින නඩු කටයුත්තකට අදාළ වන බැවින් එකී තොරතුරු අවංකව මහජන සුභ සිදිධිය සහ හෝ මහජන කටයුත්තකට අදාළව ඉල්ලා සිටිනු ලබන බවට තහවුරු නොවේ.
D. ඉල්ලා සිටිනු ලබන තොරතුරු ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම සහ අදාළ නඩුවට පෙනී සිටින නීතිඥවරු අතර පවතින නෛතිකව රහසිගත තොරතුරු වේ.
E. තොරතුරු හා විදුලි සංදේශ සියලු සේවක සංගමය මෙම නඩු කටයුත්තෙහි පාර්ශවකරුවෙකු වන අතර ඉල්ලා සිටිනු ලබන තොරතුරු අනාවරණය කිරීම නඩු කටයුත්තකට සහ ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරුන්ට එය හානිදායක විය හැකි අතර එය එය ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමට හා එහි කොටස්කරුවන්ට අහිතකර ලෙස බල පෑ හැක.
F. මෙම තොරතුරු ප්‍රසිද්ධ නොකරන ලද මිල සංවේදී තොරතුරු ලෙස සැලකෙන බැවින් අදාළ නීති සහ කොළඹ කොටස් වෙළඳපොල හෝ විනිමය හා සුරකුම්පත් පාලන කොමිෂන් සභාව විසින් පනවන ලද්දා වූ හා ඒ සම්බන්ධ නීති උල්ලංඝනය කිරීමක් වේ.

මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක 2019.02.26 දිනැතිව නම්කළ නිලධාරියාට අභියාචනයක් යොමුකළ අතර නම්කළ නිලධාරියා 2019.03.27 දිනැතිව තොරතුරු නිලධාරියාගේ තීරණයම තහවුරු කරන ලදි. මින් අතෘප්තියට පත් අභියාචක 2019.04.10 දිනැතිව කොමිෂන් සභාවට අභියාචනයක් යොමුකරන ලදි.

අභියාචක විසින් 1428/2019 ට අදාළ 2019.01.24 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා සිටින ලදි.

*ශ්‍රී ලංකා ටෙලිකොම් පි.එල්.සි. ආයතනය මගින් 2017 වර්ෂයේදී දිස්ත්‍රික් උසාවියෙහි ගොනු කරන ලද නඩු අංක DSP 03/2017 සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් පි.එල්.සි. ආයතනයෙන් හෝ අනුබද්ධිත ආයතනයන්ගෙන් වැය කරන ලද නීතිඥ ගාස්තු හා අදාළ එම වියදම මේ දක්වා ලබා දෙන්න*

තොරතුරු නිලධාරීයා විසින් ඒ සඳහා 2019.01.29 දිනැතිව පහත පරිදි ප්‍රතිචාර දක්වන ලදි.

A. ඔබ විසින් ඉල්ලා ඇති තොරතුරු මහජන සුභ සිද්ධිය සඳහා හේතු වන බවට හා/හෝ මහජන කටයුත්තකට අදාළ වන බව විශ්වාස කිරීමට සාධාරණ හේතු නොමැත.
B. ඉල්ලා සිටිනු ලබන තොරතුරු 12/2016 දරන පනතේ 5(1)a ,d ,g ,i හා j යන වගන්තිවල ප්‍රතිපාදන යටතට වැටෙන හෙයින් එය ලබා දිය නොහැක.
C. ඉල්ලා සිටිනු ලබන තොරතුරු දැනටමත් අධිකරණ ඉදිරියේ විභාග වෙමින් පවතින නඩු කටයුත්තකට අදාළ වන බැවින් එකී තොරතුරු අවංකව මහජන සුභ සිදිධිය සහ හෝ මහජන කටයුත්තකට අදාළව ඉල්ලා සිටිනු ලබන බවට තහවුරු නොවේ.
D. ඉල්ලා සිටිනු ලබන තොරතුරු ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම සහ අදාළ නඩුවට පෙනී සිටින නීතිඥවරු අතර පවතින නෛතිකව රහසිගත තොරතුරු වේ.
E. තොරතුරු හා විදුලි සංදේශ සියලු සේවක සංගමය මෙම නඩු කටයුත්තෙහි පාර්ශවකරුවෙකු වන අතර ඉල්ලා සිටිනු ලබන තොරතුරු අනාවරණය කිරීම නඩු කටයුත්තකට සහ ශ්‍රී ලංකා

ටෙලිකොම් සමාගම වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරුන්ට එය හානිදායක විය හැකි අතර එය එය ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමට හා එහි කොටස්කරුවන්ට අහිතකර ලෙස බල පෑ හැක.

F. මෙම තොරතුරු ප්‍රසිද්ධ නොකරන ලද මිල සංවේදී තොරතුරු ලෙස සැලකෙන බැවින් අදාළ නීති සහ කොළඹ කොටස් වෙළඳපොල හෝ විනිමය හා සුරැකුම්පත් පාලන කොමිෂන් සභාව විසින් පනවන ලද්දා වූ හා ඒ සම්බන්ධ නීති උල්ලංඝනය කිරීමක් වේ.

මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක 2019.02.26 දිනැතිව නම්කළ නිලධාරියාට අභියාචනයක් යොමුකළ අතර නම්කළ නිලධාරියා 2019.03.27 දිනැතිව තොරතුරු නිලධාරියාගේ තීරණයම තහවුරු කරන ලදි. මින් අතෘප්තියට පත් අභියාචක 2019.04.10 දිනැතිව කොමිෂන් සභාවට අභියාචනයක් යොමුකරන ලදි.

අභියාචක විසින් 1429/2019 ට අදාළ 2019.01.24 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා සිටින ලදි.

*ශ්‍රී ලංකා ටෙලිකොම් පි.එල්.සි. ආයතනය මගින් 2017 වර්ෂයේදී කම්කරු උසාවියෙහි ගොනු කරන ලද බේරුම්කරණ අංක A /26/2017 සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් පි.එල්.සි. ආයතනයෙන් වැය කරන ලද නීතිඥ ගාස්තු හා අදාල එම වියදම මේ දක්වා ලබා දෙන්න*

තොරතුරු නිලධාරියා විසින් ඒ සඳහා 2019.02.20 දිනැතිව පහත පරිදි ප්‍රතිචාර දක්වන ලදි.

A. ඔබ විසින් ඉල්ලා ඇති තොරතුරු මහජන සුභ සිද්ධිය සඳහා හේතු වන බවට හා/හෝ මහජන කටයුත්තකට අදාළ වන බව විශ්වාස කිරීමට සාධාරණ හේතු නොමැත.
B. ඉල්ලා සිටිනු ලබන තොරතුරු 12/2016 දරන පනතේ 5(1)a ,d ,g ,i හා j යන වගන්තිවල ප්‍රතිපාදන යටතට වැටෙන හෙයින් එය ලබා දිය නොහැක.
C. ඉල්ලා සිටිනු ලබන තොරතුරු දැනටමත් අධිකරණ ඉදිරියේ විභාග වෙමින් පවතින නඩු කටයුත්තකට අදාළ වන බැවින් එකී තොරතුරු අවංකව මහජන සුභ සිදිධිය සහ හෝ මහජන කටයුත්තකට අදාළව ඉල්ලා සිටිනු ලබන බවට තහවුරු නොවේ.
D. ඉල්ලා සිටිනු ලබන තොරතුරු ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම සහ අදාළ නඩුවට පෙනී සිටින නීතිඥවරු අතර පවතින නෛතිකව රහසිගත තොරතුරු වේ.
E. තොරතුරු හා විදුලි සංදේශ සියලු සේවක සංගමය මෙම නඩු කටයුත්තෙහි පාර්ශවකරුවෙකු වන අතර ඉල්ලා සිටිනු ලබන තොරතුරු අනාවරණය කිරීම නඩු කටයුත්තකට සහ ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරුන්ට එය හානිදායක විය හැකි අතර එය එය ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමට හා එහි කොටස්කරුවන්ට අහිතකර ලෙස බල පෑ හැක.
F. මෙම තොරතුරු ප්‍රසිද්ධ නොකරන ලද මිල සංවේදී තොරතුරු ලෙස සැලකෙන බැවින් අදාළ නීති සහ කොළඹ කොටස් වෙළඳපොල හෝ විනිමය හා සුරැකුම්පත් පාලන කොමිෂන් සභාව විසින් පනවන ලද්දා වූ හා ඒ සම්බන්ධ නීති උල්ලංඝනය කිරීමක් වේ.

මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක 2019.02.26 දිනැතිව නම්කළ නිලධාරියාට අභියාචනයක් යොමුකළ අතර නම්කළ නිලධාරියා 2019.03.27 දිනැතිව තොරතුරු නිලධාරියාගේ තීරණයම තහවුරු කරන ලදි. මින් අතෘප්තියට පත් අභියාචක 2019.04.10 දිනැතිව කොමිෂන් සභාවට අභියාචනයක් යොමුකරන ලදි.

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

අභියාචනා විභාගය සඳහා දෙපාර්ශවයම පැමිණ ඇති බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටී.

RTIC/Appeal/1427/2019, 1428/2019, 1429/2019 යන අභියාචනාවල සන්දර්භය එක හා සමාන බැවින් මෙම අභියාචනා ත්‍රිත්වයම එකට සළකා බලන ලදි.

පොදු අධිකාරිය විසින් 2019.11.25 දිනැතිව සිය ලිඛිත කරුණු දැක්වීම් කොමිෂන් සභාව වෙත ගොනුකර ඇති බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටී.

ඒ අනුව RTIC/Appeal/1427/2019, 1428/2019, 1429/2019 අභියාචනයන්ට අදාළව පොදු අධිකාරිය විසින් **2019.11.25** දිනැතිව වෙන් වෙන් වශයෙන් ලිඛිත කරුණු දැක්වීම් කොමිෂන් සභාවට ගොනු කරමින් සඳහන් කර ඇත්තේ අභියාචක විසින් ඉල්ලා ඇති තොරතුරු, තොරතුරු පනතේ **5(1)**(අ), (ඇ), (ඊ), (උ) (එ) හා (ඒ) වගන්ති යටතේ ලබාදිය නොහැකි බවයි.

අභියාචනා විභාගයේදී පොදු අධිකාරිය නියෝජනය කළ නීතිඥවරයා ප්‍රධාන අංශ කීපයක් යටතේ සිය කරුණු දැක්වීම සිදුකරන ලදි.

අභියාචක විසින් විමසා ඇති පරිදි අනුබද්ධිත ආයතනයන්හි ඊට අදාළ තොරතුරු පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව සිය භුක්තිය, පාලනය හෝ සන්තකයේ නොමැති බවටත් ඒවා අදාළ අනුබද්ධිත ආයතනයන්ගෙන් ඉල්ලා සිටිය යුතු බවටත් කරුණු දක්වන ලදි.

පොදු අධිකාරිය කරුණු දක්වා සිටින ලද්දේ තොරතුරු පනතේ 5(1)(අ) වගන්තිය ප්‍රශ්නගත තොරතුරු ඉල්ලීමට අදාළ වන බවයි. එනම්, අභියාචක විසින් ඉල්ලා ඇති තොරතුරු වන නීතිඥවරුන්ගේ ගාස්තු පිළිබඳ තොරතුරු ඍජුවම පුද්ගලික තොරතුරු වන බවත්, එම තොරතුරු හෙළිදරව් කිරීමෙන් එය එම නීතිඥවරුන්ගේ හා ඔවුන්ගේ නියෝජිතයන්ගේ පුද්ගලිකත්වය අනවසරයෙන් ආක්‍රමණය වීමක් සිදුවන බවයි. එසේම අභියාචක විසින් එම තොරතුරු හෙළිදරව් කිරීම විශාල වශයෙන් මහජන සුභසිද්ධිය විසින් සාධාරණීකරණය කිරීමක් සිදුකර නොමැති හෙයින් එම තොරතුරු ලබාදීමට හැකියාවක් නොමැති බවට කරුණු දක්වන ලදි.

ඒ අනුව මෙම තොරතුරු හෙළිදරව් කිරීම සාධාරණීකරණය කිරීම සඳහා පවත්නා මහජන සුභසිද්ධිය කවරක්ද යන්න කොමිෂන් සභාව විසින් අභියාචකගෙන් විමසා සිටින ලදි. ඊට ප්‍රතිචාර ලෙස අභියාචක කරුණු දක්වා සිටියේ, මෙහිදී සේවක වරප්‍රසාද අහිමිවීම මගින් පාරිභෝගික සුබසිද්ධියට බලපෑම් එල්ල වී ඇති අතර ආයතනයේ අභ්‍යන්තර විගණන වාර්තාවලින් සැලකිය යුතු දූෂණ වංචා සිදුව ඇති බව පිළිගෙන ඇති බවයි. එමගින් ආයතනය බිඳ වැටීම දක්වා ගමන් කරන බවත් මෙ කරුණ මහජන සුභසිද්ධිය ඉස්මතු කරන්නක් බවට අවධාරණය කරන ලදි.

පොදු අධිකාරිය විසින් තොරතුරු පනතේ 5(1)(ඇ) වගන්තිය ප්‍රකාරව එනම්, අදාළ තොරතුරු හෙළිදරව් කිරීම යම් තෙවන පාර්ශවයක තරගකාරී තත්වයකට අහිතකරව බලපාන බවත් සඳහන් කරන ලදි. එසේ වුවද මෙම තොරතුරු හෙළිදරව් කිරීමට හේතුවන මහජන සුභසිද්ධිමය කාරණාව පෙන්වා දීමට අභියාචක අසමත්ව ඇති බවටද සඳහන් කරන ලදි.

පොදු අධිකාරිය විසින් තොරතුරු පනතේ 5(1)(ඊ) වගන්තියේ අදාළත්වය සම්බන්ධවද කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කළේ වෘත්තිකයින් හා එම වෘත්තිකයින් විසින් සේව සපයනු ලබන යම් පොදු අධිකාරියක් අතර පවතින යම් සන්නිවේදනයක සංයුක්ත වන්නා වූ තොරතුරු අභියාචක විසින් මෙහිදී ඉල්ලා ඇති බැවින් එම වගන්තිය ප්‍රකාරව තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කළ හැකි බවයි.

එසේම තොරතුරු පනතේ 5(1)(උ) වගන්තිය ප්‍රකාරවද එනම්, භාරකාර සම්බන්ධතාවක් පැවතීම හේතුවෙන් එම තොරතුරු රහසිගතව තබාගැනීම අවශ්‍ය වන අවස්ථාව යන්න මෙහිදී නීතිඥවරයා හා සේවාදායකයා අතර ඇති සබඳතාවය විශ්වසනීය භාරකාරත්ව සම්බන්ධතාවක් හේතුවෙන් ලබාදිය නොහැකි බවට සඳහන් කළ අතර සිය ස්ථාවරය සනාථ කිරීම සඳහා Shri Aseem Takyar Vs. Delhi

Metro Rail Corporation [CIC/VS/A/2012/001426/04589] හා Kapugeekiyana Vs. Hettiarachchi [1984 2 Sri LR] යන නඩු තීන්දු උපුටා දක්වන ලදි.

එසේම තොරතුරු පනතේ 5(1)(ඵ) වගන්තිය ප්‍රකාරව අදාළ තොරතුරු තෙවන පාර්ශවයක් විසින් අදාළ පොදු අධිකාරිය වෙත රහසිගතව සපයා ඇති අවස්ථාවක් වීම හේතුවෙන්ද තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කළ හැකි බවට පොදු අධිකාරිය විසින් කරුණු දක්වන ලදි. මීට අදාළව කොමිෂන් සභාව විසින් අවධාරණය කර සිටියේ මෙම වගන්තියේ ආරක්ෂණය අයැද සිටීමට නම් පනත ප්‍රකාරව අදාළ තෙවන පාර්ශවයෙන් ඒ සම්බන්ධව ලිඛිතව ප්‍රකාශයක් තොරතුරු හෙළි කිරීමට අකමැත්ත ප්‍රකාශ කරමින් ලබාගත යුතු බවයි.

එසේම අවසාන වශයෙන් මෙම තොරතුරු දැනටමත් දිසා අධිකරණයේ හා කම්කරු අධිකරණයේ විභාග වෙමින් පවත්නා නඩුවලට අදාළ වන බවත් ඒ අනුව පනතේ 5(1)(ඒ) වගන්තිය ප්‍රකාරව එම තොරතුරු හෙළිදරව් කිරීම අධිකරණයට අපහාස කිරීමක් හෝ අධිකරණයේ අධිකාරී බලය හා අපක්ෂපාතීබව පවත්වාගෙන යාමට අගතියක් සිදුවන බවට පොදු අධිකාරිය විසින් කරුණු දක්වා සිටින ලදි.

පොදු අධිකාරියේ මෙම කරුණු දැක්වීම් සළකා බලමින් කොමිෂන් සභාව විසින් අවධාරණය කළේ දැනටමත් විභාග වෙමින් පවත්නා නඩුවලට අදාළ තොරතුරු වීම හා මහජන සුභසිද්ධිය යන කාරණා ප්‍රශ්නගත සිදුවීමේදී ප්‍රමුඛතාවක් ලබා ගන්නා බවයි.

නියෝගය:

ඒ අනුව පොදු අධිකාරියේ මෙම කරුණු දැක්වීම සඳහා ප්‍රතිචාර ලෙස ප්‍රශ්නගත සිදුවීමට අදාළව මහජන සුභසිද්ධිය ඉස්මතු වන්නේ කෙසේද යන්න පිළිබඳව විධිමත්ව ලිඛිත කරුණු දැක්වීමක් කොමිෂන් සභාවට පිටපතක් සහිතව පොදු අධිකාරියට යොමුකිරීමටත් අනතුරුව එම ලිඛිත කරුණු දැක්වීමට අදාළව පොදු අධිකාරියේ ස්ථාවරය පිළිබඳ ලිඛිත කරුණු දැක්වීමක් කොමිෂන් සභාවට පිටපතක්ද සහිතව අභියාචකට යොමුකිරීමටත් කොමිෂන් සභාව විසින් නියෝග කර සිටී.

මීළඟ අභියාචනා විභාගය 2020 ජනවාරී 21 දින ප.ව. 4.00ට කල්තබන ලදි.

---

RTIC Appeal (**පුද්ගලික වශයෙන් විභාග කිරීම**)/ 1427/2019, 1428/2019, 1429/2019 (2020.01.21 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

| | |
|---|---|
| **සභාපති:** | මහින්ද ගම්මම්පිල |
| **කොමිෂන් සභා සමාජික:** | ජොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන |
| **කොමිෂන් සභා සමාජික:** | ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා |
| | |
| **අධ්‍යක්ෂ ජනරාල් :** | වසන්ත හපුආරච්චි |
| | |
| **අභියාචක** | - **ජේ.බී. ගුරුසිංහ** |

**නොතිසි ලත් පාර්ශවය** - නම්කළ නිලධාරී, **ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී.**

**පෙනීසිටීම**
අභියාචක - **ජේ.බී. ගුරුසිංහ**
පොදු අධිකාරිය - නීතිඥ රජීව් අමරසූරිය
නීතිඥ ඇන් දේවානන්ද
නීතිඥ පූජනි ගලප්පත්ති

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

අභියාචනා විභාගය සඳහා දෙපාර්ශවයම පැමිණ ඇති බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටී.

2019.12.13 වන දින අභියාචක විසින් සිය ලිඛිත කරුණු දැක්වීමක් කොමිෂන් සභාවට ගොනුකරමින් සඳහන් කර ඇත්තේ අදාළ නඩුකර හා බේරුම්කරණය සඳහා නීතිඥ සමාගම්වලට ගෙවූ නීතිඥ ගාස්තු ගෙවා ඇත්තේ ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ වියදමක් වශයෙන් බවත් එම වියදම් පැහැදිලිවම ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී හි ලාභය අඩුවීම වෙනුවෙන් සෘජුවම බලපාන බවයි. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ කොටස්වලින් 49.5% ප්‍රතිශතයක් සෘජුවම මහ භාණ්ඩාගාරයට ඇති නිසාත් තවත් 3% කට වඩා වැඩි ප්‍රතිශතයක් රාජ්‍ය ආයතනවලට හිමිව ඇති නිසාත් මෙම ලාභය අඩුවීමේ ප්‍රතිඵලය සෘජු ලෙසම මහා භාණ්ඩාගාරයටත්, ටෙලිකොම් සමාගමේ කොටස් හිමි රාජ්‍ය ආයතනවලටත් බලපෑමක් සිදු කරන බවයි. එසේම ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය COPE (පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව) කමිටුව විසින් අධීක්ෂණය කරනු ලබන ආයතනයක් වන අතර 2014.08.05 දිනැතිව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මුද්‍රණය කිරීමට නියෝග කරන ලද අතුරු වාර්තාවේ සඳහන් වන බැවින් COPE කමිටුව අධීක්ෂණය කරනු ලබන්නේ මහජන මුදල් භාවිත කරන ආයතන පමණක් වන බවයි. ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී ආයතය මේ දක්වා කිසිදු විරෝධයකින් තොරව කෝප් කමිටු විමර්ශනයන්ට පෙනී සිටීමෙන් එම ආයතනය මහජන මුදල් භාවිත කරන බව ඔවුන් විසින්ම සැකයකින් තොරව පිළිගෙන ඇති බව ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී විසින් 2017.10.11 දිනැතිව නිකුතු අංක 001 යටතේ ඉදිරිපත් කර ඇති ලේඛනයෙන් සනාථ වන බවයි. ඒ අනුව ඉහත පැහැදිලි කිරීම ප්‍රකාරව අභියාචක විසින් නගා ඇති ප්‍රශ්නයට අදාළ වියදම මහජන අරමුදලකින් කරන ලද්දක් බව පැහැදිලි වන බවයි.

මීට අමතරව මෙම මුදල් වැය නොකලේ නම් එමඟින් ජනතාවට සපයන සේවාවන් වැඩිදියුණු කිරීම හෝ එකී සේවාවන්ගේ ගාස්තු පහළ දැමීම හෝ කළ හැකිව තිබූ නිසා අභියාචක විසින් ඉල්ලා ඇති තොරතුරුවලට අදාළ වියදම සෘජු ලෙසම මහජනයාට සපයන සේවාවන්වලට බලපාන්නාවූ කරුණක් වන බවයි.

ඒ අනුව අභියාචක විසින් මෙමගින් ඉල්ලා ඇත්තේ අදාළ නඩුකර හා බේරුම්කරණයට අදාළ තොරතුරු කිසිවක් නොවන අතර මහජන මුදල්වලින් 2017 වසරේ සිට මේ දක්වා අදාළ නඩුකර හා බේරුම්කරණය වෙනුවෙන් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය විසින් කරන ලද වියදම් පමණක් වන අතර එකී වියදම ඔවුන් දරනු ලැබුවේ මහජන අරමුදල්වලට බලපෑමක් කරන අන්දමින් නිසා බවත් අභියාචක පාර්ශ්වය වැඩිදුරටත් කරුණු දක්වන ලදි.

පොදු අධිකාරිය විසින් මෙහිදී කරුණු දක්වා සිටින ලද්දේ සිය ලිඛිත කරුණු ගොනු කිරීමේදී අභියාචක පාර්ශ්වය විසින් සති තුනකට ආසන්න කාලයක් ප්‍රමාද වී ඇති බැවින් ඔවුන්ගේ එම කරුණු දැක්වීම් මත පදනම්ව පොදු අධිකාරියෙහි කරුණු දැක්වීම සඳහා ප්‍රමාණවත් කාලයක් ලබාදෙන ලෙසට කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින ලදි.

**නියෝගය:**

ඒ අනුව සිය ලිඛිත කරුණු ගොනු කිරීමේදී අභියාචක පාර්ශ්වය විසින් සති තුනකට ආසන්න කාලයක් ප්‍රමාද වී ඇති බැවින් අභියාචක පාර්ශ්වයේ එම කරුණු දැක්වීම් මත පදනම්ව පොදු අධිකාරියෙහි කරුණු දැක්වීම සඳහා ප්‍රමාණවත් කාලයක් ලබාදෙමින් මීළඟ අභියාචනා විභාගය 2020.03.21 දින ප.ව. 2.30ට කල්තබන ලදි.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.
*****